

දුල්නෙත් සෙතික ජයසූරිය

# දුලා

දුල්නෙත් සෙතික ජයසූරිය

ISBN - 978-624-208-092-5

කෘතිය පළ කරන දිනය – 2023-12-10

# පිදුම

ආදරණීය අම්මාට, තාත්තාට...

නාට්‍ය තුළින් ජීවිතය කියාදෙන

අමිතා රබ්බිඩිගල ගුරුතුමියට,

පොතක් ලියන්නට මා උනන්දු කර වූ,

ආදරණීය ජීවනී වත්තගේ ගුරුතුමියට,

සමන්මලී ගුරුතුමියට,

මගේ කතාවේ මට මුණගැසෙන ආදරණීය

ඔබ සැමට... ආදරයෙන්

පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම පඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩ ගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මග පෙන්වීම යටතේ ලේඛණකරනය සහජයෙන් උරුම කරගත් මහාමයා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථ කරනයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනයක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශයතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක් වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතතක් " ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක, ලේඛකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන් ආදිශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමු කල විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන්අයුරින් උදවු උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමයා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-11-01

# හැඳින්වීම

" දුලා "

නම් වූ මෙම පොත තුළ

මාගේ ජීවිත කතාව කෙටියෙන්

රසවත්ව ඉදිරිපත් කිරීමට

මම උත්සහ කරමි.

දෙමාපියන්ගෙන් අසා දැනගත්

තොරතුරු සහ මා හට මතක

මගේ ජීවිත කතාව

නැවතත් මා කුඩා කාලයට

රැගෙන ගියා සේ දැනෙයි.



දුල්නෙත් සෙතික ජයසූරිය

# ස්තුතිය

මෙලෙස පොතක් නිර්මාණය කිරීමට
මා උනන්දු කරවූ
දයාබර ජීවනී වත්තගේ ගුරුතුමියට
මෙම පොත නිර්මාණයේදී
මා හට උපදෙස් ලබා දුන්
දයාබර අම්මාට, තාත්තාට
මාගේ ජීවිත කතාව රසවත් කළ
හරවත් කළ ඔබ සැමට...
ස්තුතියි

දුල්නෙත් සෙතික ජයසූරිය


මගේ නම දුල්නෙත් හැබැයි හැමෝම මට කතා කරන්නේ " දුලා " කියලා. ඉස්සෙල්ලාම මට " දුලා " කියන නම කිව්වේ නාට්‍ය පන්තියේ මගේ යාලුවෝ ටික

ඉස්සෙල්ලා ම මම පන්තියකට කියලා ගියේ නාට්‍ය පන්තියට, අමිතා රබිබිඩිගල මැඩම් තමයි අපිට නාට්‍ය ඉගැන්නුවේ. පන්තියක් කිව්වට අකුරු නම් ලිව්වේ නෑ. අපි නැටුවා, සින්දු කිව්වා, රඟපෑවා අපි, අපි ගැන කතා කරා. හරිම විනෝදයෙන් තමයි ඉගෙන ගත්තේ. ඉතිං ඔන්න ඔතනින් තමයි "දුලා" කියන නම වගේම මට මතක මගේ කතාවත් පටන් ගන්නේ.

අපේ ගෙදර ඉන්නේ අම්මයි, තාත්තයි, මමයි, අත්තම්මයි, සීයායි තව මට පුංචි පූස් යාළුවෝ තුන් දෙනෙකුත් ඉන්නවා. ගාෆිල්ඩ්, චූටි, ඩොටී තමයි මේ තුන්දෙනා. මං දවස පටන් ගන්නේත් දවස ඉවර කරන්නේත් මේ තුන්දෙනා එක්ක.



මං හරිම ආසයි මගේ ඇල්බම් එක බලන්න. හැබැයි තනියම නෙවෙයි. ගෙදර අයත් එක්ක. මම පුංචි කාලේ ඉඳලා හැම විශේෂ අවස්ථාවකම වාගේ ගත්ත පින්තූර අපේ අම්මා ඇල්බම් එකට එකතු කරලා තියෙනවා. ඉතිං මං හරිම ආසයි ඒක බලන ගමන් අයෙමත් මගේ පුංචි කාලෙට යන්න. මම ඉපදිලා තියෙන්නේ පේරාදෙණිය රෝහලේ. පවුලේ පළවෙනි දරුවා නිසා හැමෝම බලාගෙන ඉඳලා තියෙන්නේ මං එනකං අම්මා නම් කියන්නේ පුංචි කාලේ මම පොඩ්ඩක්වත් කරදර කළේ නැහැ කියලා. අම්මයි, තාත්තයි දෙන්නම ව්‍යාපාර කටයුතු කරපු නිසා එයාලට එහෙම දැනෙන්න ඇති.



මට මතකයි මම ඉස්සෙල්ලා ම ගියපු මොන්ටිසෝරිය. ඒක හරිම ලස්සන නිදහස් තැනක්. හෙළ පියුම් ටීචර්, ඇලන් ටීචර්, භාග්‍යා ටීචර්, එයාලා අපිට හරිම ආදරෙයි. මම නම් හරිම ආසාවෙන් අවුරුදු දෙකක් ම මොන්ටිසෝරි ගියා කියලා තමයි අම්මා කියන්නේ.

එහිදී මුණ ගැහුන යාලුවෝ ගැන මට ලොකු මතකයක් නැතත් කීප දෙනෙක් අදත් මට මගේ ඉස්කෝලෙදී මුණ ගැහෙනවා.

මගේ තාත්තාත් කිංස්වුඩ් මහත්මයෙක් උන නිසා මමත් කිංස්වුඩ් එකට යන්න හරිම ආසාවෙන් තමයි හිටියේ. 1-R පන්තියේ මගේ පළවෙනි ගුරුතුමිය වුණේ දුලනි දවුලගල මැඩම්. ඉතින් මම හරිම ආසාවෙන් වගේම හරිම ආඩම්බරයෙන් කිංස්වුඩ් මහත්මයෙක් විදිහට ඉස්කෝලේ ගියා. එක එක විදිහේ යාළුවෝ මුණ ගැහුනා.




අපි හැම නිවාඩුවකට ම මහියංගනේ යන්න පුරුදු වෙලා හිටියා. එහෙ හිටියේ අපේ අත්තම්මයි, ලොකු අම්මලයි. එහෙ ගියාම අපි කරන ලොකුම වැඩේ තමයි ඇළේ පැනලා නටන එක, වැවේ නාන්න යන එක , වෙලේ ඇවිදින එක, ලොකු මිදුල පුරාම දුව දුව සෙල්ලම් කරන එක,  මම එහෙ ගියාම සෙල්ලම් කරන්නේ  දහම් අයියයි, සිංගි අක්කයි එක්ක. ඒ අපේ ලොකු අම්මගේ දුවයි, පුතයි. අත්තම්මා අපි කන්න කැමති කෑම බීම හදලා දෙනවා. ලොකු අම්මලා එක්ක අපි සොරබොර වැවේ නාන්න යනවා. මං දන්නෙම නැතුව නිවාඩුවත් ගෙවිලා යනවා.

එක වසර දෙක වසර අපි ඉස්කෝලේ ගියත් තුන, හතර වසර වලදි කොරෝනා වසංගතය නිසා අපට ඉස්කෝලේ යන්න බැරිවුණා. ඔන්ලයින් පාඩම් කරත් යාළුවෝ මුණ ගැහෙන්න බැරි වුණ නිසා හිතට දැනුනේ ලොකු දුකක්. ඒ කොහොම වුනත් අපේ නාට්‍ය පන්තියේ වැඩ ටික නම් අකුරටම කෙරුණා...



“ මී පුරවැසියෝ ” තමයි වේදිකාවක මං කරපු පළවෙනි නාට්‍ය... ඒ පේරාදෙණිය ඉංජිනේරු පීඨයේ තිබුණු විශාල ශාලාවක... ඊට පස්සේ “ රාජකීය බල්ලෝ ” නාට්‍ය අපි නාට්‍ය තරඟයකට පුහුණු වුණත්, පෙර පුහුණුවක් විදිහට ඒකත් අපි තරුණ බෞද්ධ සංගම් ශාලාවේ ප්‍රදර්ශනය කළා. ඔය අතරේ ස්වර්ණවාහිනිය, රූපවාහිණිය වැනි ආයතන වල තිබුණු ළමා වැඩසටහන් වලටත් මම සහභාගී වුණා. රඟපාන්න වගේම මම හරිම ආසයි සින්දු කියන්න, වාදනය කරන්න ඉතිං මං ඒවත් අමතර විෂයන් හැටියට ආසාවෙන් ඉගෙන ගත්තා... ඔය අතරේ ඉඳලා හිටලා චිත්‍රයක් අඳින්නත් මම අමතක කරේ නෑ...



මේ හැමදේම අතරේ ඉරිදා උදේම නැගිටලා දහම් පාසල් යන්නත් මම හරිම ආසයි. පන්සලේ නායක හාමුදුරුවෝ මට හරිම ආදරෙයි... මොකද පුරුද්දක් විදිහට මම ඉරිදා උදේ වැඩසටහනේ හැමදාම මොනවාහරි අංගයක් ඉදිරිපත් කරන නිසා.

දහම් පාසලේ ඉන්න හා පැටවුන්ට අපි හැමදාම කෑම දෙනවා... අපි සිල් ගන්නවා, භාවනා කරනවා, දහම් පාසල ඉස්කෝලෙට වඩා වෙනස් තැනක්.

ඔන්න ඉතිං මම පහ වසර පන්තියටත් ආවා.. එක දිගටම ඉස්කෝලේ එන්න බැරි වුණත් ඒ අතර නාට්‍ය, සංගීතය වගේ දේවල් වලට කාලය යොදවපු නිසා ඒ අවුරුදු දෙක ප්‍රයෝජනවත් විදිහට ගත කරන්න ලැබුණා.



පහ වසර අපේ පන්ති භාරව හිටියේ ජීවනී වත්තගේ මැඩම්... මැඩම් හරිම ලස්සනයි... හැබැයි කට නම් හරිම සද්දයි... ශිෂ්‍යත්වය අත ළඟම එන නිසා ඒ වෙනුවෙන් අපව සූදානම් කරන්න මැඩම් ගොඩක් මහන්සි වුණා... හැබැයි ඒ හැමදේම අතරේ අපි සිංදු  කිව්වා, කතන්දර කිව්වා, නාට්‍ය කරා, පුංචි පුංචි තරඟ කරා, උගන්නන ගමන් මැඩම් අපිත් එක්ක බොහොම විනෝදයෙන් හිටියා..



පහ වසර පන්තියේදී ම තමයි බාලදක්ෂ කරන අපේ කබෝරිය තිබ්බේ... ඒක නම් මගේ ජීවිතේ අමතක නොවන දවස් ටිකක් වුණා... අපි රෑට නිදා ගත්තේ ඉස්කෝලේ අපේ පන්තියේ බිම මෙට්ට දාලා...උදේම නැගිටලා, මූණ හෝදලා, කෑම කලා... අපි මේ හැමදේම කරේ තනියම. දහවල් වරුවේ එක එක විදිහේ ක්‍රියාකාරකම් ගොඩක් කරනවා. හවසට නාලා අපි රෑට හොල්මන් කතා කියනවා, සින්දු කියනවා, අපි ලස්සන නාට්‍යකුත් කළා ඒක ලිව්වේ මම. රඟපෑවේ අපේ පන්තියේ බාලදක්ෂ කරන යාළුවෝ... ජීවනි මැඩම් අපිට ගොඩක් උදව් කරා.. ඒක නම් මට කවදාවත් අමතක වෙන්නේ නැතිවෙයි...



ඉතිං තවත් දෙයක් කියන්නම ඕනේ මේ හැමදේම කරන අතරේ මම ප්‍රාථමික අංශයේ ශිෂ්‍ය නායකයෙක් විදිහටත් වැඩ කරා. කණ්ඩායමක් එක්ක වැඩ කරන විදිය, වගකීම් දරන විදිහ මං ඒතනිනුත් ඉගෙන ගත්තා.

අපි යාලුවෝ එකතු වුණාම පුංචි පුංචි මගඩි වැඩත් කරා. සඳුල්, යෙනුෂ අපි තුන්දෙනා එකතු වුනාම මොකක් හරි මගඩියක් තමයි. සඳුල්ගේ අම්මත් අපෙ ඉස්කෝලේම ගුරුවරියක්. පුංචි විවේකයක් ලැබුණ ගමන් අපි දුවන්නේ සඳුල්ගේ අම්මා ශිරානි මැඩම්ගේ පන්තියට. ශිරානි මැඩම් හරිම හොඳයි. අපට තියෙන ප්‍රශ්න වලට වගේම පොඩි බඩගින්නටත් මැඩම්ගෙන් විසඳුම් ලැබෙනවා.



ශිෂ්‍යත්වය අත ළඟටම ඇවිත් තියෙන අතරේ ඔන්න ඉතිං මගේ තවත් නාට්‍යයක් වේදිකාගත කෙරුණා. " පිට්ටු එපා හපොයි " ඒ නාට්‍යයේ ප්‍රධාන චරිතය කළේ මම. සහස් උයනේ කරපු මේ නාට්‍යයට ගොඩක් හොඳ ප්‍රතිචාර තිබුණා. රබ්බිඩිගල මැඩම්ටත් එදා හුඟක් සතුටු දවසක් කියලා තමයි මට හිතුණේ.




ඉතිං මේ හැමදේම කරන අතරේ පොත පතේ වැඩත් මම කරා. මේ හැමදේකදීම මගේ අම්මයි, තාත්තයි මට ලොකු හයියක් වුණා. ඉස්කෝලේ දී මගේ අඩුපාඩු හදා ගන්න ජීවනි මැඩම්, ශිරානි මැඩම් මට ගොඩක් උදවු කළා. රබ්බිඩ්ගල මැඩම් හැම වෙලාවකදීම වැඩ කරන්න ඕන විදිහ කියලා දුන්නා. මම ශිෂ්‍යත්වයට බොහොම සතුටින් සැහැල්ලුවෙන් මුහුණ දුන්නා.



ඔන්න ඉතින් දුලාගේ කතාව. ඉස්සරහට මේකෙ මොනවා ලියවෙයිද කියලා මම දන්නේ නෑ... හැබැයි ඉතින් දුලා කියන්නේ හරිම විනෝදයෙන් සැහැල්ලුවෙන් ගොඩක් දේවල් ඉගෙන ගන්න කැමති කෙනෙක්.



මං හිතනවා මගේ කතාවෙන් ඔයාලත් ගොඩක් දේවල් ඉගෙන ගන්න ඇති කියලා. ඉතිං අපි අපට ලැබෙන හැම අවස්ථාවකම විනෝදයෙන් සැහැල්ලුවෙන් ඉන්නවා වගේම අපේ අනාගතයට වටිනා කියන දේවල් එකතු කරගන්නත් අමතක කරන්න හොඳ නැහැ.... තේරුනාද යාළුවනේ.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම, ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසර් දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟා වීමට නූතන තාක්ෂනය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය තික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමණයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසැල් මට්ටමින් ආරම්භ කර ජාතිකතලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

" දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරනයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023-11-01